CareerMe™

වෘත්තීය මාර්ගෝපදේශකත්වය පිළිබඳ පුරෝගාමියා

# වෘත්තීය පරීක්ෂණ ප්‍රතිඵල

පුද්ගලිකයි රහසිගතයි.

ERANDA

සඳහා සකස් කරන ලදී.

නිකුත් කළ දිනය: 2017 නොවැම්බර් 27

# මෙම වාර්තාව පිළිබඳ

ඔබේ රුචිකත්වයට ගැලපෙන රැකියාවක් හා අධ්‍යාපන මග

මෙම ඇගයීම CareerMeහි නිමැවුමක් වේ. එමගින් ඔබේ පුද්ගලික ශක්තීන්, කුසලතා හා විභව්‍ය වෘත්තීය ලැදියාවන් හඳුනා ගැනීම සඳහා මනෝමිතික ක්‍රියාමාර්ග භාවිතා කරයි. මෙම වාර්තාව සමග රැකියාවන් සහ ඔබේ ලැදියාවන්ගැලපීමේ ගමන ආරම්භ විය හැකිය.

වෙනත් දත්ත මූලාශ්‍ර සමග යොදා ගන්නා විට මෙම වාර්තාව ඔබට අගනා සහායක් වනු ඇත. එය තනිව භාවිතා කිරීමට අදහස් නොකෙරේ. ඔබේ ප්‍රතිඵල ඔබට වැදගත් වන පුද්ගලයන්, එනම් ඔබේ පවුල හා වෘත්තීය උපදේශකවරයා සමග සාකච්ඡා කිරීමට අවශ්‍ය කාලය ලබා ගන්න. මෙහි ඇති එක් ප්‍රබල වාසියක් වන්නේ ඔබ විසින් පසු විපරම් කළ යුතු ඔබේ ශක්තීන්ට අදාළ ක්ෂේත්‍ර හඳුනාගත හැකි වීමයි.

ඔබේ පුද්ගලිකකරණය කරන ලද වාර්තාව කොටස් තුනකට වෙන් කෙරේ. පළමු කොටස රැකියා ස්ථානයේ ඔබේ පෞරුෂත්වය පිළිබඳ විස්තර කෙරෙන පුද්ගල පෞරුෂය වේ. දෙවන කොටස ඔබේ රැකියාවෙහි විභව්‍ය මනාපයන් පිළිබඳ සාරාංශයක් වන එය වාර්තා කර ඇති රුචිකත්වයන් මත පදනම් වේ. අවසාන වශයෙන් මෙම වාර්තාව මගින් අපේක්ෂා කරන රැකියාවන් වෙත ළඟා වීම සඳහා සැලැස්මක් තෝරා ගැනීම හා සකස් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර නිර්දේශ කෙරේ.

ප්‍රශ්නාවලිය සඳහා අවංකව පිළිතුරු සැපයුවේ නම් වාර්තාව ඉහළ මට්ටමේ නිරවද්‍යතාවක් පෙන්නුම් කරයි. කෙසේවුවද, හිතාමතා රැවටීමට උත්සාහ කළහොත් එය වලංගු නොවේ. මෙම වාර්තාව නිර්මාණය කර ඇත්තේ ඔබේ රැකියා අවස්ථාවන් පුළුල් කිරීම හා ඔබේ රුචිකත්වයන්ට ගැලපෙන මාර්ග රැසක් ගවේශණය කිරීමේ අවස්ථාව ඔබට සලසා දීම සඳහාය.

ඔබ කවුරුන්දැයි අවබෝධ කරගන්න

# පටුන


| මාතෘකාව | පිටු අංකය |
|---|---|
| 1. ඔබේ පුද්ගල පෞරුෂය ........................................................ | 2 |
| 2. රැකියාවට අදාළ රුචිකත්වයන් ...................................... | 4 |
| 3. ඔබේ මීළඟ පියවර ............................................... | 5 |



T: 077 9798480
E: info@careerme.lk

CareerMe

# 1. ඔබේ පුද්ගල පෞරුෂය


අපගේ වෘත්තීය පිළිබඳ පරීක්ෂණය මගින් රුචිකත්වයන් වර්ග 6ක් පිළිබඳ මැන බලනු ලැබේ: එනම් යථාර්ථවාදී (R), විමර්ශනාත්මක (I), කලාත්මක (A), සමාජශීලී (S), උත්සාහවන්ත (E) හා සාම්ප්‍රදායික (C). මෙම ක්ෂේත්‍ර 6 සඳහා ඔබේ මුළු ලකුණු සංඛ්‍යාව පහත දැක්වේ. ඉහළම ලකුණු ලබා ඇති රුචිකත්වයන් තුන රැකියාවට අදාළ ඔබේ පෞරුෂත්ව ආකාරය ලබා ගැනීම සඳහා භාවිතා කෙරේ. මෙය රුචිකත්වය පිළිබඳ කේතය (Interest Code) නමින් හඳුන්වන අක්ෂර තුනේ කේතයක් ලෙස ඉදිරිපත් කෙරේ. පරීක්ෂණයේ එක් එක් කොටසට අදාළ ලකුණු ප්‍රමාණය පිටුවේ පහළ කෙළවරේ දැක්වේ.

පරිශීලක අනන්‍යතාව: 117

ස්ත්‍රී පුරුෂභාවය: පුරුෂ

නම: eranda

වයස: 26




*මෙය ක්ලික් කිරීම මගින් ක්ෂේත්‍ර පිළිබඳ දැනගන්න.*

→ ඔබේ පුද්ගල පෞරුෂය පිළිබඳ වෘත්තීය උපදේශකවරයෙකු සමග කතා කරන්න

→ ඔබේ රුචිකත්වයන්ට ගැලපෙන සා.පෙළ. හා උ.පෙළ විෂයන්

## ඔබේ රුචිකත්වය පිළිබඳ කේතය:

උත්සාහවන්ත (E)

විමර්ශනාත්මක (I)

යථාර්ථවාදී (R)

*ඔබේ ඉහළම රුචිකත්වය සහිත ක්ෂේත්‍රය උත්සාහවන්ත ක්ෂේත්‍රය වන අතර විමර්ශනාත්මක හා යථාර්ථවාදී ක්ෂේත්‍රයන් ද ඉන් පසුව ලැදියාව සහිත ක්ෂේත්‍රයන් වේ.*

එක් එක් කොටසට අදාළ පරීක්ෂණ ලකුණු සටහන

| ලකුණු ප්‍රමාණය | R | I | A | S | E | C |
|---|---|---|---|---|---|---|
| ඔබ? | 20 | 19 | 18 | 18 | 20 | 18 |
| ඔබට හැකිද? | 14 | 16 | 11 | 14 | 17 | 17 |
| ඔබ කැමතිද? | 9 | 10 | 7 | 14 | 17 | 3 |
| සිත් ගන්නා සුළු රැකියාවන් | 9 | 10 | 3 | 5 | 9 | 4 |
| මුළු දළ ලකුණු ප්‍රමාණය | 52 | 55 | 39 | 51 | 63 | 42 |


T: 077 9798480
E: info@careerme.lk

E, I, R යනු ඔබේ වෘත්තීය පෞරුෂත්ව ආකාරයයි

# උත්සාහවන්ත - විමර්ශනාත්මක - යථාර්ථවාදී

*ඔබේ පෞරුෂත්ව ආකාරය ඉහත රුචිකත්ව ක්ෂේත්‍ර තුනේ එකතුවකි. ඔබේ ඉහළම රුචිකත්ව ක්ෂේත්‍රයට (උත්සාහවන්ත) අදාළව ඔබේ පෞරුෂත්වය පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් පහතින් දැක්වේ. ඔබේ නිශ්චිත වූ රුචිකත්වයන්ගේ එකතුව පිළිබඳ වැඩිදුර අවබෝධ කර ගැනීම සඳහා අපගේ වෘත්තීය උපදේශකවරයා සමග කතා කරන්න.*

## උත්සාහවන්ත – පොළඹවන්නන්

### චරිත ලක්ෂණ

ඔබ ආත්ම විශ්වාසය, අධිෂ්ඨාන පූර්වක, අන් අය පෙළඹවිය හැකි හා ජව සම්පන්න අයෙකි. ඔබ තරඟකාරී, අවදානම් ගැනීමට කැමති හා නායකත්වය ගැනීමට කැමති අයෙක් ද වේ.

ඔබ ව්‍යාවසායී ස්වභාභාවයකින් යුතු, ව්‍යාපෘති ආරම්භ කිරීමට කැමති හා ඔබේ කටයුතුවලට සහාය දෙන පරිදි අන්අය තුළ විශ්වාසය ගොඩනැගිය හැකි අයෙකි.

සංවිධානයේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ඔබේ පුද්ගලාන්තර, නායකත්ව හා පෙළඹවීමේ කුසලතාවන් භාවිතා කිරීමට ඔබට හැකියාව ඇත.

ඔබ විසින් ඔබව හඳුනා ගන්නේ නායක්තවය ගැනීමට හා කතාකිරීමට දක්ෂ නමත් විද්‍යාත්මක හැකියාවන් අඩු අයෙකු ලෙසයි.

ඔබ කතා කිරීමේ දක්ෂයෙකු වන අතර ඵලදායී ලෙස පිරිසක් ඇමතීමේ හැකියාව ඔබ සතුවේ.

පොදුවේ මිනිසුන් ඔබ සමාජශීලී අයෙකු ලෙස හඳුනා ගත්තද ඇතැමෙක් ඔබ ආධිපත්‍යය පතුරුවන කෙනෙකු ලෙස සැලකිය හැකිය.

ඔබ තත්වය, කීර්තිය අගය කරන අතර මෙම අපේක්ෂාවන් මුදුන් පමුනුවාගත හැකි රැකියා අවස්ථා සොයයි.

### රුචිකත්වයන්

ඔබ ව්‍යාපාරික කටයුතු, භාණ්ඩ විකිණීම, අදහස් ප්‍රවර්ධනය, මිනිසුන්ට බලපෑම් කිරීම හා ගණුදෙනු සිදු කිරීමට කැමැත්තක් දක්වන අයෙකි.

ඔබ භෞතික දේ හා අදහස් සමග කටයුතු කිරීමට වඩා මිනිසුන් සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අයෙකි.

### අරුචි දේ

ඔබ තනිව කටයුතු කිරීම, බුද්ධිමත් කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීමට, සංකීර්ණ ගණනය කිරීම් සිදු කිරීමට, නිත්‍ය වැඩ හා විද්‍යාත්මක/ ගණිතමය ක්‍රියාකාරකම් කිරීමට අකමැත්තක් දක්වයි.

### කුසලතා හා ශක්තීන්

නායකත්වය ලබා දීම, කළමනාකරණය, ව්‍යාපාරික අවස්ථා සෙවීම, විකිණීම හා මිනිසුන් පොළඹවා ගැනීම ඔබ තුළ වන ප්‍රබල හැකියාවන් වේ.

### වෘත්තීන්

ඔබ නායකත්වය, කළමනාකරණය හා විකුණුම් කෙරෙහි දිරිගන්වන සහ මුදල්, බලය හා තත්වය ප්‍රතිලාභ ලෙස ලබා දෙන කාර්ය පරිසරයකට වැඩි කැමැත්තක් දක්වයි.

ඔබ විසින් සලකා බැලිය යුතු උත්සාහවන්ත රැකියාවන්වලට කළමනාකරු, චිත්‍රපට නිෂ්පාදක, ව්‍යාපාරික/ අලෙවිකරණ විධායක, අලෙවිකරු, නීතිඥ හා ව්‍යවසායක ආදී වෘත්තීන් ඇතුළත්වේ.

### උපාධි අධ්‍යයනයන් සඳහා තෝරා ගත හැකි විෂය ක්ෂේත්‍රs

උපාධි අධ්‍යයනයන් සඳහා තෝරා ගත හැකි විෂය ක්ෂේත්‍ර ඔබට පහත විෂය ක්ෂේත්‍ර පිළිබඳ සලකා බැලිය හැකිය:

නීතිය, ව්‍යාපාර කළමනාකරණය හා පරිපාලනය, ජාත්‍යන්තර ව්‍යාපාර, දේශපාලන විද්‍යාව, අලෙවිකරණය හා විකුණුම්.

*මෙය ක්ලික් කිරීම මගින් ඔබේ වෙනත් කැමති ක්ෂේත්‍ර පිළිබඳ දැනගන්න.*

CareerMe උපදේශකවරයා සමග ඔබේ රුචිකත්ව ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධ කරගන්න

→ CareerMe සමග තවත් රැකියා අවස්ථාවන් සොයාගන්න

# 2. රුචිකත්වයට අදාළ රැකියා

ඔබේ රුචිකත්වයන්ට අදාළ ක්ෂේත්‍ර තුනම සම්බන්ධ වන කටයුතු සැලකිල්ලට ගෙන ඔබට ගැලපෙන විභව්‍ය රැකියාවන් සොයාගන්න. උත්සාහවන්ත - විමර්ශනාත්මක -යථාර්ථවාදී යන සංකලනය යටතේ වන රැකියාවන් කිහිපයක් පහත දැක්වේ.

| කේතය | රැකියාව | කුසලතා මට්ටම |
|---|---|---|
| EI | නීතිඥයන් / Lawyers | 5 |
| IE | දේශගුණ විපර්යාස විශ්ලේෂකයන් / Climate Change Analysts | 5 |
| IE | කාර්මික පරිසරවේදීන් / Industrial Ecologists | 5 |
| IRE | ජල/ අපජල ඉංජිනේරුවන් / Water/Wastewater Engineers | 4 |
| IRE | නැනෝ පද්ධති ඉංජිනේරුවන් / Nanosystems Engineers | 5 |
| IRE | පාරිසරික පුනරුත්ථාපන සැලසුම්කරුවන් / Environmental Restoration Planners | 5 |
| RIE | සුළං ශක්ති ඉංජිනේරුවන් / Wind Energy Engineers | 4 |
| EI | ස්වභාවික විද්‍යා කළමනාකරුවන් / Natural Sciences Managers | 5 |
| EI | පොලිස් රහස් පරීක්ෂකවරුන් / Police Detectives | 3 |
| EI | අපරාධ පරීක්ෂකවරුන් හා විශේෂ නියෝජිතයන් / Criminal Investigators and Special Agents | 3 |
| ERI | වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු විද්‍යාත්මක කළමනාකරුවන් / Architectural and Engineering Managers | 5 |
| ERI | අළෙවි ඉංජිනේරුවන් / Sales Engineers | 4 |
| IRE | කෘෂිකාර්මික ඉංජිනේරුවන් / Agricultural Engineers | 4 |
| IRE | ගිනි වැළැක්වීමේ හා ආරකාෂාව පිළිබඳ ඉංජිනේරුවන් / Fire-Prevention and Protection Engineers | 4 |
| IRE | ද්‍රව්‍ය ඉංජිනේරුවන් / Materials Engineers | 4 |
| IRE | භූ විද්‍යාත්මක ඉංජිනේරුවන් / Geological Engineers | 4 |
| IRE | පාංශු හා ජල සංරක්ෂකයන් / Soil and Water Conservationists | 4 |
| RIE | වන කළමනාකරුවන් / Range Managers | 4 |
| RIE | වන ආරක්ෂක නිලධාරීන් / Foresters | 4 |
| RIE | ස්වභාවික සම්පත් කාර්මික ශිල්පීන් / Natural Resource Technician | 3 |
| RIE | වාණිජ ගුවන් නියමුවන් / Commercial Pilots | 3 |

→ දැනටමත් රැකියාවක්/අධ්‍යාපන ක්ෂේත්‍රයක් පිළිබඳ ඔබට අදහසක් තිබේද? එහි වාසි හා අවාසි පිළිබඳ දැනගැනීම සඳහා

T: 077 9798480
E: info@careerme.lk

රැකියාවක් සඳහා අවශ්‍යවන අධ්‍යාපන මට්ටම

# 3. ඔබේ මීළඟ පියවරයන්

රැකියා ලෝකය තුළට ඇතුළත් වීම අභියෝගාත්මක ක්‍රියාවලියක් වේ. තෝරා ගැනීමට රැකියාවන් රැසක් වන නමුත් ඔබේ රුචිකත්වයන්ට ගැලපෙන්නේ ඒ අතරින් කිහිපයක් පමණි. රැකියාවක් පිළිබඳ තීරණයක් ගත් පසුව එම රැකියාව ලබා ගැනීම සඳහා ඔබේ අධ්‍යාපනික විකල්පයන් හඳුනා ගැනීම ද අවශ්‍ය වේ.

රැකියාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ප්‍රශ්න කිහිපයක් පහතින් දැක්වේ.

1) රැකියාව සඳහා සාමාන්‍ය වැඩ කරන සතියක් වන්නේ කුමක්ද?

2) අවම අධ්‍යාපනික අවශ්‍යතාවන් මොනවාද?

3) රැකියාවෙහි වාසි හා අවාසි මොනවාද?

4) මෙම රැකියාව මගින් මාගේ අවශ්‍යතා ඉටු වේද? (මුදල්, සබඳතාවන්, පුද්ගලික සංවර්ධනය, බලාපොරොත්තු ආදිය)

දෙගිඩියාවේ සිට දැනුවත් තීරණයක් වෙත

සෑම කෙනෙකුටම මෙම ගැටළු ඇති අතර සෑම කෙනෙකුටම අතිරේක සහාය මගින් ප්‍රතිලාභ සලසා ගත හැකිය. මෙම ක්‍රියාවලියේදී ඔබට සහාය වීම සඳහා අපගේ වෘත්තීය උපදේශකවරයෝ පූර්ණ සූදානමින් පසුවෙති.




පරීක්ෂණයට මුහුණ දෙන්න | උපදේශකවරයා හමුවන්න | වෘත්තීය ක්‍රියාකාරී සැලැස්ම

*(ආදර්ශය බලන්න)*

ඉහතින් දක්වා ඇත්තේ CareerMe මාර්ගෝපදේශ ක්‍රියාවලියෙහි නිදර්ශනයකි. පළමු පියවර සම්පූර්ණයි. මෙම වාර්තාවේ පූර්ණ ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා ඔබ පිළිබඳ හා ඔබ විසින් සලකා බැලිය යුතු අධ්‍යාපන හා වෘත්තීය තෝරා ගැනීම් පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමටත් අපගේ උපදේශකවරයා හමු වීම ඵලදායක වනු ඇත.

උපදේශකවරයා හමුවන්න

*අපගේ ක්ෂණික ඇමතුම් අංකය වන 0779798480ට ඇමතීමෙන් හෝ info@careerme.lk වෙත ඊ මේල් පණිවිඩයක් එවීමෙන් ඔබට වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය*

**වියාචනය:** මෙම ලේඛනයේ අරමුණ ස්ව අවබෝධය ලබා ගැනීමයි. එය සකස් කර ඇත්තේ පුද්ගලයන්හට තමන්ගේ ස්වභාවික පෞරුෂත්ව ශක්තීන් සහ වෘත්තීය රුචිකත්වයන්, කුසලතා සහ අගයන් හඳුනා ගැනීම සඳහාය. පරීක්ෂණ ප්‍රතිඵල මානසික සෞඛ්‍ය, හා/හෝ වෛද්‍ය ගැටළු හඳුනා ගැනීම, රෝග විනිශ්චය, හෝ ප්‍රතිකාර කිරීම සඳහා යොදා නොගත යුතුය. ස්ව අවබෝධය සඳහා මෙම සහාය ලබා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු කරන ක්‍රියාවන් හෝ ගනු ලබන තීරණ කෙරෙහි පූර්ණ වගකීම පරිශීලකයා විසින් දැරිය යුතුය. මෙම ඇගයුම භාවිතා කිරීමෙන් හෝ එය භාවිතා කිරීමට අදාළව පැන නගින, CareerMe හි හිමිකරුවා වන සීමාසහිත Ednext Analytics පුද්ගලික සමාගම, අනුබද්ධිත ආයතන හෝ පාසල්, හා/හෝ ඒවායේ සේවකයන්, කෙරෙහි වන ඕනෑම හා සියළු ආකාරයේ හිමිකම් CareerMe මාර්ගගත ඇගයුම භාවිතා කිරීම මගින් ඔබ විසින් අත්හරිනු ලැබේ.

T: 077 9798480
E: info@careerme.lk